# රනිල් සමග

සමන්තිකා
බණ්ඩාරනායක



දශක ගනනාවක් පුරා රසික හදවත් සනහාලූ ඒ දයාබර කට හඬ අපි අතරින් සමුගෙන වසර 15ක් ගතවී හමාරයි. නමුත් ඒ හඬ අපිට තාමත් නිතර ඇහෙනවා. අපි අහන්න ආසයි. මිල්ටන් මල්ලවාරච්චි වූ ඒ සොඳුරුතම චරිතය ඒ දයාබර හඬ අපිට කවදාවත් අමතක කරන්න බැරි ඒ නිසයි. 1998 මාර්තු 10 වන දින ඔහු දැයෙන් සමුගත්තා. වසර 15 පිරෙන මේ වසරේ ඔහුගේ ආදරණීය පුත් රනිල් මල්ලවාරච්චි ඔහුට උපහාර පුද කරන්න ඔහු දැනට ජීවත් වන මෙල්බන් සිට ලංකාව බලා ගියා. නැවතත් රනිල් මෙල්බන් බලා ඇවිත් බව ආරංචි වුන නිසා මම ගියා ඔහු සොයාගෙන ඒ තොරතුරු ඔබත් සමඟ බෙදාගන්න.

**ඉතින් රනිල් කොහොමද ජීවිතය ?**
ගොඩක් හොඳින් ඉන්නවා

**රනිල් ලංකාවට ගිහින් තිබුනා විශේෂ දෙයක් නිසා. අපිට කියන්නකෝ තොරතුරු ඒ ගැන.**
ඔව් මම දෙසැම්බර් 10 ලංකාවට ගියා මාස 2 X ක කාලයක් එහි ඉඳලා පෙබරවාරි 21 තමයි මෙල්බන් ආවේ. ලංකාව අමතක කරන්න අමාරුයි. අපි ඉපදුන රට නිසා මම මෙල්බර්න් ජීවත් වෙන්නෙ මගේ දරු දෙන්නාගේ අධ්‍යාපනය නිසයි. ඒ වැඩ ඉවර උන ගමන් මම බිරිඳත් සමඟ ලංකාවට නැවත යනවා.

**රනිල් ලංකාවේදි ඔබ පියාගේ දැවැන්ත ප්‍රසංගයක් කලා කියලා අපි මාධ්‍ය හරහා දුටුවා. ඒ ගැන යමක් කිව්වොත්.**
ඔව් මම ගියේ ඒ කාරණය නිසා තමයි. මේ ප්‍රසංගය සංවිධානය කලේ මගේ මිත්‍ර රජීව් සෙබස්කතියන්. ජනවාරි 19 වන දින කොළඹ නෙළුම් පොකුණ රංග ශාලාවේ තමයි මේ ප්‍රසංගය පැවැතුනේ. මට ඕන උනේ තාත්තා අපෙන් වෙන් වෙලා වසර 15ක් උන නිසා ඔහු වෙනුවෙන් යමක් කරන්න සහ ඔහුගේ විශාල රසික සංඛ්‍යාවක් ඉන්නවා ඔවුන්ට යමක් කරන්න. ඇත්තටම එය මම හිතපු ආකාරයටම සිදු උනා. ඒකට මම සහය උන රජීවටත් මම ස්තූතිවන්ත වෙනවා. මිනිස්සු තාමත් ඒ ගැන කතා කරනවා. මට තාමත් මෙහෙට දුරකථන ඇමතුම් දෙනවා ඒ ප්‍රසංගයට ප්‍රශංසා කරලා. මම ඒ ගැන ගොඩක් සතුටුයි. මම තාත්තා වෙනුවෙනු දෙයක් කලා කියලා.



**ඔබත් සමඟ මේ සඳහා ගීත ගායනයෙන් තව අය එකතු උනා නේද ?**
ඔව් මගේ පියා සමඟ ඔදා යුග ගීත වලින් සහ උන ඉන්ද්‍රානි පෙරේරා මහත්මිය, ඇන්ජලින් ගුණතිලක මහත්මිය, ශාර්මි ෆොන්සේකා මහත්මිය සහාය උනා. ඒ වගේම වරනන් පෙරේරා මහතා සහ ටජිනි පෙරේරාත් සහාය උනා. මෙහිදි තව විශේෂතම සිදුවීම තමයි මගේ තාත්තා 1984 දී ඈතින් ඈතට චිත්‍රපටයේ (කැන්දම් යන්නම්) ගීතයට හොඳම ගායකයා ලෙස සරසවි සම්මානය ලබා ගත්තා. එදා ඒ ගීතය ගායනා කලේ ග්‍රේෂන් ආනන්ද මහතා. මේ ප්‍රසංගයේදී ග්‍රේෂන් අංකල්ගේ පුතා මාරියෝ මේ ගීතය ගායනා කලා. ඉතින් මේක නරඹන්නන්ට ඉතාම මවිත කල අංගයක් බවට පත් උනා. ඒක දුර්ලභ අවස්ථාවක්.

**රනිල් ඔබ පියා වගේම අලුත් දේ ඉදිරිපත් කරන කෙනෙක්. මට මතකයි ලංකාවේ යුගල ගී ගැයීමේ කලාවක් ඔබ සහ හර්ෂ හඳුන්වා දුන්නා. මේ පාරත් ඔබ ලංකාවේ තුන්වෙනි පරම්පරාව පලමුවෙන්ම ඔබ ලංකාවට හඳුන්වා දුන්නා නේද ?**
ඔව් ලංකාවේ තුන්වෙනි පරම්පරාවට මම එදා වේදිකාවේ මගේ පුතාව හඳුන්වා දුන්නා. එදා ඒ ගායනා කරපු ගීතයත් මගේ ජීවිතේ වැදගත්ම ගීතය. ඒක මම ගායනා කලේ මගේ පියාත් සමඟ. එදා මම ඒක මගේ පුතා පවන් එක්ක ගායනා කලා.

**පවන් පුතාගේ වයස කීයද ? කොහොමද සංගීතයට ඔහුගේ තියෙන කැමැත්ත ?**
පුතාට දැන් වයස 14යි. මම ගීත ගායනා කරන්න මුලින්ම එනකොට වයස 18 යි. නමුත් මගේ පුතා කලින්ම ඇවිත්. ඔහු ඇත්තටම දක්ෂයි. මේ වන විට ඔහුගේම නිර්මාණ කරලා ඉවරයි. ඔහුගේ පලමු ගීතය පටිගත කරලා ඉවරයි. ලඟදීම මෙල්බන් වල ඒ ගිතය ඇසෙයි. ඒක ලිව්වේ එයාමයි. එයා ජීවිතය දැක්කේ පටන් ගත්තේ මෙල්බන් වලින්. ඒ ගීතය එයා ලියලා තියෙන්නනේ මෙල්බන් නගරයට. ඉංග්‍රීසි භාෂාවෙන් තමයි මෙල්බන් ගීතය ගායනා කලේ. ඒ වගේම තමයි මගේ පියාගේ ගීතයක් එයාම ඉංග්‍රීසි බසට හරවලා එයා ගායනා කලා. ඒක ඇත්තටමඑයත් එක්ක කරන්නේ භාතිය හා සංතුෂ් සමඟ. ඒකේ වැඩත් ලංකාවෙදි ඉවර කලා. ඉදිරියේදී ඒකත් අහන්න ලැබෙයි. එයාට ඕනේ සීයාගේ සංදු ජාත්‍යන්තරයට අරගෙන යන්න. ඒක තමයි එයාගේ එකම අරමුණ. එයා දැනටමත් පාසලේදීත් ගායනයෙන් දක්ෂකම් පෙන්නලා ඉවරයි. පාසලේ බෑසබටැර එයා තමයි. පාසලේ ගුරුවරුන්ගේ උනත් එයාගේ ගායන හැකියාවට උපරිම සහයෝගය දෙනවා. ඔවුන්ට උනත් වැටහිලා තියෙන්නේ මෙයාට හොඳ හඬක් තියන බව සහ ඒ සඳහා උනන්දු කරන බව. මා සමඟත් පවසා තිබෙනවා. අපි එයාට සින්දු කියන්න කියලා කියන්නේ නැ. එයාට ඕනම දෙයක් කරන්න සම්පූර්ණ නිදහස දීලා තියෙන්නේ දැනටමත් එයා මෙල්බන්වල ගුවන් නියාමක වරයෙක් හැටියට මෙල්බන්වල පුරුදු වෙනවා. මෙල්බන් නුවර ලාබාලතම ගුවන් නියමුවරයා හැටියට ඉන්නේ මගේ පුතා.

**දුව අනුපජා සංගීතයට කැමතිද පවන් අයියා වගේම.?**
ඔව් එයාටත් ගායන හැකියාව තියෙනවා. එයාට තාම වයස අවු. 10යි. ඒ නිසා දැන්ම කියන්න බෑ මොනවා කරයිද කියලා. නමුත් දැනට එයා වයලිනය වාදනය කරනවා.

**දරු දෙදෙනාගේ අධ්‍යාපන කටයුතු වගේම ඔබගේ මෙතෙක් ආ සංගීත දිවියත් සමග ඔබේ බිරිඳ නිරාෂා සහය වෙන්නේ කොහොමද ?**
ඇත්තටම ඔස්ට්‍රේලියාවේ අපි යමු කියලා තීරණය කලේ එයා. මමත් කැමති උනා ඒ දේට. නිරාෂාගෙන් ලැබෙන සහය මට වචනයෙන් කියන්න බෑ. අද වන විට මට ගුණ යහපත් සිරිත් විරිත් පිරුණ දරුවෝ දෙන්නෙක් ඉන්නේ එයා නිසයි. නිරාෂා වගේ බිරිඳක් ලැබුනේ මගේ වාසනාවට. මගේ ලමයි දෙන්නයි මමයි හරි වාසනාවන්තයි කියලා මම හිතනවා. අපි හරිම ලස්සන පවුලක් හැටියට ජීවත් වෙනවා.

**රනිල් ඔබගේ ප්‍රසංගයේ ෘඪෘ මෙල්බන් වල තියෙන බව ආරංචියි. එය මිලදී ගත හැක්කේ කොහෙන්ද ?**
ඔව් සියළුම ශ්‍රී ලාංකික වෙළඳ සැල්වල මෙය මිලදී ගන්න අවස්ථාව තියෙනවා.

ඔබට බොහොම ස්තූතියි මේ දේවල් අප සමඟ පැවසුවට. ඔබගේ පවුලට ඔබ කිවූ ඒ වාසනාව ආදරය හැමදාම පවතීවා යන ප්‍රාර්ථනයෙන් අපි සමුගන්නවා.


IMMIGRATION @
IMMIGRATION
LAWYERS

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Our team of Specialist Lawyers, Barristers and Registered Migration Agents in Melbourne competently assisted many Sri Lankans, South Asians and many other nationalities and Australian Companies in the following areas of Migration matters over 14 years.

General Skill Migration Permanent Residence
General Skill Migration Provisional Residence
Second stage Skilled Regional (Permanent Residence)
State Sponsored Skill Migration
Graduate Skill Temporary visas
Complex Student visas
457 Visas
Employer Nominations (ENS)
Employer Contracts
Negotiations of employer nominations with the Australian Employers
Regional Sponsored Migration Scheme (RSMS)
Skill Assessments
State Sponsorships
TRA cancellations
Criminal Prosecutions on TRA cancellations
Student Visa Cancellations
Permanent residence Cancelations
Appeals to the Migration Review Tribunal (MRT)
Administrative Review Tribunal (AAT)
Business Migration State Sponsorships
Business Migration visas
Spouse & visas
Aged Parent visas
Contributory Parent visas
Resident Return visas
Australian Citizenships

GLISS DESIGN



Our Team:

LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

Susantha Katugampala LL B (Monash)
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

Michael Gros LL B (Monash)
Consulting Barrister
MARN: 9803398

Al Noveloso
Migration Consultant
MARN: 0849632

Frank Sabelberg LL B (Monash)
Consulting Solicitor
MARN: 0004726

Lindy Noone
Migration Consultant
MARN: 0322507

Sri Lanka
AUSTRALIA GATEWAY
Australian Migration Consultants
Hilton Colombo Towers
200 Union Place Colombo 02
Telephone: +94 11 2300 627
+94 777 347 670

Australia
FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
10, Morrison Place
East Melbourne Victoria 3002
Telephone: +61 3 9650 4557
Interstate Callers: 1300 888 331
Fax: +61 3 9650 4559

E: info@fairfieldslawyers.com Mobile: 0430 699 961 or 0419 863 771

We Deliver Results..